*__2015 වසරේ දී පුරන් වූ කුඹුරක් වැනි රටක් බාර ගෙන විවිධ අභියෝග මධ්‍යයේ එය සකස් කරමින් වී වපුරා, දැන් අස්වැන්න නෙළන තත්ත්වයට පත් කර තිබෙන බවත්, ඉදිරි කාලයේ දී පාක්ෂිකයන්ට මෙන්ම රටට එහි අස්වැන්න භුක්ති විඳිය හැකි බවත් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සිරිකොත, පක්ෂ මූලස්ථානයේ දී අද (06) පැවසීය.__*

*__ජන බලයක් කොළඹට කැඳවා, කොළඹ වටලන බවට පසුගිය දා විශාල ප්‍රචාරයක් දියත් කළත්, අවසානයේ පොහොට්ටුවේ ජන බලයත්, මාධ්‍යයේ පච බලයත් නැති වූ බව ද රනිල් වික්‍රමසිංහ මහතා පැවසීය.__*

*__අද (06) සිරිකොත, පක්ෂ මූලස්ථානයේ පැවැති එක්සත් ජාතික පක්ෂයේ 72 වන සංවත්සර උළෙල අමතමින් ඒ බව පැවසූ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා එහිදී තවදුරටත් අදහස් දක්වමින් මෙසේද පැවසීය.__*

අප අද දින එක්සත් ජාතික පක්ෂයේ 72 වන සංවත්සරය සමරනවා. ෆාම් කෝට් මන්දිරයෙන් ආරම්භ වූ එක්සත් ජාතික පක්ෂයේ වර්තමාන මූලස්ථානය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි සිරිකොත මන්දිරයයි.

පසුගියදා මට දුරකතන ඇමතුමක් ලැබුණා. ජනබලය රැලිය පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබෙන නිසා අපේ මෙම සංවත්සර උත්සවය පැවැත්විය යුතු දැයි එම දුරකතන ඇමතුම් හරහා මගෙන් විමසා සිටියා. සංවත්සර උත්සවය නතර කරන්නේ ඇයි දැයි එවිට මම ඔවුන්ගෙන් විමසුවා. පොහොට්ටුව කොළඹ වට කරලා බලය ලබාගන්නවා යැයි මාධ්‍යයෙන් පවසා තිබෙන බවත්, ශිෂ්‍යයන් සහ ජනතාව බියට පත් කරමින් සිටින බවත් ඔවුන් මට පැවසුවා.

අපි අපේ සංවත්සර රැළිය අනිවාර්යෙන් පැවැත්විය යුතු බවත් ඔවුන්ගේ රැළිය අවශ්‍ය නම් පවත්වා ගනු ඇති බවත් මම එවිට පැවසුවා. නමුත් අවසානයේ බලන විට පොහොට්ටුවේ ජන බලයත්, මාධ්‍යයේ පච බලයත් දෙකම නැති වුණා. නමුත් එක්සත් ජාතික පක්ෂයත් අපේ සංවත්සරයත් අවසානයේ ඉතුරු වී ඇති බව මම සතුටෙන් ප්‍රකාශ කරනවා.

සැප්තැම්බර් 05 වැනි දා සිදු වූ ඓතිහාසික කටයුත්ත නම් පළමු වතාවට නිවාස යෝජනා ක්‍රම 138 ක් නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් ආරම්භ කිරීමයි. එම පුවත විකාශය කළ එක් මාධ්‍යයක් හෝ සිටිනවාද? එවැනි එක් මාධ්‍යවේදියෙකු හෝ සිටිනවා නම් මම අමාත්‍ය ධුරයක් ලබාදෙනවා. ලංකාවේ මාධ්‍යට එක්සත් ජාතික පක්ෂය විනාශ කළ නොහැකියි. ඩී.එස් සේනානායක යුගයේ සිට එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කළ නායකයින්ටත් සාමාජිකයින්ටත් මම ස්තූතිවන්ත වෙනවා.

අප පක්ෂය නිර්මාණය කරන්නේ ජයගත හොත් ආණ්ඩුවක් හදා රට ගොඩනැගීමට බවත් පරාජයට පත්වුව හොත් විපක්ෂයට ගොස් ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට බවත් ඩී.එස්.

සේනානායක මහතා එදා ප්‍රකාශ කළා. ගත වූ වසර 72 ක කාලය තුළ දී මෙම කාර්යයන් දෙකම එක්සත් ජාතික පක්ෂය විසින් සිදුකළ බව මම පැවසිය යුතුයි.

ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, ජෝන් කොතලාවල, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, ඩී.බී. විජේතුංග වැනි මහත්වරුන් මෙම පක්ෂයේ නායකත්වය දැරුවා. ජයග්‍රහණ ලබාගත්තා. පරාජයට පත්වූ අවස්ථාවල පක්ෂය ආරක්ෂා කළා. උතුරේත් දකුණේත් ඇති වූ භීෂණවලට අප මුහුණ දුන්නා. නමුත් මෙම පක්ෂය නැතිවුනේ නැහැ. ශ්‍රී ලංකාවේ මුල් බැස ගත් දේශපාලන ව්‍යාපාරය මෙයයි. 1947 දී ආරම්භ කෙරුණු දේශපාලන පක්ෂ අතුරින් වර්තමාන පාර්ලිමේන්තුවේ ඉතිරි වී තිබෙන්නේ දේශපාලන පක්ෂ කීයද? එක්සත් ජාතික පක්ෂය හැර වෙනත් කිසිම පක්ෂයක් නොමැති බව පැවසිය යුතුයි. එම නිසා එවැනි පක්ෂයක සාමාජිකයෙක් වීම සම්බන්ධයෙන් මම ආඩම්බර වෙනවා. ඔබ සියලු දෙනාමත් ඒ පිළිබඳව ආඩම්බර වනු ඇතැයි මා විශ්වාස කරනවා.

2015 දී අප ආණ්ඩු බලය ලබාගත්තා. ඒ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ලෙස නොව ජාතික ආණ්ඩුවක් ලෙසයි. ඒ මේ රටේ ප්‍රශ්න විසඳීම සඳහායි. ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ලෙස ජයග්‍රහණය කළා. මම අගමැති ලෙස තේරී පත් වුණා. නමුත් අපි බර ගත්තේ ණය බරින් පිරුණු කුඹුරක් බව කිව යුතුයි. අධික ණය බර නිසා මේ කුඹුර විකිණීමට සිදුවන තත්ත්වයට පැමිණ තිබුණා. මේ තත්ත්වය හමුවේ කුඹුරේ පැරණි අයිතිකරුවන් පැන ගියා. වසර ගණනාවක් වගා නොකිරීම නිසා කුඹුර පුරන් වී තිබුණා. ඒ තත්ත්වය දැන දැනත් අප එය බාර ගත්තා.

කුඹුර වගා කිරීමට නොහැකිව අතහැර දැමීමට සිදුවනු ඇතැයි බොහෝ අය සිතුවා. ණය, නියඟය, ගංවතුර ආදී සියලුම උවදුරුවලට අප මුහුණ දුන්නා. නමුත් අප අපේ කුඹුර වැපිරීම අමතක කළේ නැහැ. දැන් එහි අස්වැන්න නෙලන කාලයයි. එම අස්වැන්න අපේ පාක්ෂිකයන්ට මෙන්ම රටටත් ලබාදෙමු. අප කුඹුර මේ තත්ත්වයට ගෙන ආවේ ඉතා අපහසුවෙන් බව පැවසිය යුතුයි. වෙනත් කිසිවෙකුත් ඒ මොහොතේ රට බාර ගත්තා නම් බංකොලොත් තත්ත්වයට පත් වෙනවා. අප රට බාර ගත්තේ එතරම්ම අපහසු කාලයකයි.

අපි ණය බරින් මිදීමට අවශ්‍ය කටයුතු සිදු කරන අතරම රටේ සංවර්ධන කටයුතුත් ඉටු කළා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 2000 සිට 5000 දක්වා වැඩි කළා. විශ්ව විද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගණක ලබා දුන්නා. "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ පාසල් 9000 කට ගොඩනැගිලි ලබා දී තිබෙනවා. මුළු ශ්‍රී ලංකාවේම තිබෙන්නේත් පාසල් 10,000 ක් පමණයි. ඒ වගේම විදුහල්පති ඇබෑර්තු 4000 ක් පිරවීමට කටයුතු කළා. පාසැල් ශිෂ්‍යයින් රක්ෂණය කිරීමට කටයුතු කළා. අප මේ වැඩ කටයුතු සිදු කළේ අප බාරගත් කුඹුරේ අස්වැන්න ලැබීමටත් පෙරයි.

ඖෂධ මිල අඩු කිරීමට අප කටයුතු කළා. සුව සැරිය ආරම්භ කළා. නිවාස යෝජනා ක්‍රම 10,000 ක් ආරම්භ කළා. අපේ පළමු අයවැය මගින් රාජ්‍ය සේවක වැටුප් රුපියල් 10,000 කින් වැඩි කළා. ඉන්ධන මිල අඩු කළා. ජී.එස්.පී. ප්ලස් තීරුබදු සහනය නැවත රටට ලබා ගත්තා. මැතිවරණවල දී කාන්තා නියෝජනය වැඩි කළා. සියල්ලටම වඩා රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමට අප කටයුතු කළා. අද අපේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක්. අද ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ගැටලුවක් නැහැ.

ඔබතුමාලා සිටින තුරු අපිට ගැටලුවක් නැති බව දිනක් සන්ධානයේ මන්ත්‍රීවරයෙක් මා සමග පැවසුවා. ගැටලු ඇති වන්නේ ඔබලා බලයට පත්වුවහොත් යැයි මා එහිදී ඔහු සමග කියා සිටියා.

අප රට බාර ගත්තේ නැත්නම් රට සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. අවුරුදු 2 කට පෙර ජනාධිපතිවරණය පැවැත්වුවේ අප නොවෙයි. ඔවුන්ට රට හදන්නට බැරිව සිටින විට අපි රට බාර ගත්තා. උද්ඝෝෂණයක් හරියාකාරව කර ගැනීමට නොහැකි අය රටක් කරන්නේ කෙසේද?

හම්බන්තොට වරාය එදා සුදු අලියෙක් බවට පත් වී තිබුණා. අද හම්බන්තොට ආර්ථික කේන්ද්‍රස්ථානයක් බවට පත් කර තිබෙනවා. මත්තල ගුවන් තොටුපොළත් ඒ ආකාරයටම සාර්ථකත්වයට පත් කරනවා. මේ කටයුතු අප කරන්නේ ඉතා අසීරු තත්ත්වයක සිට බව මතක තබා ගත යුතුයි. වැට් බදු වැඩි කරන්න සිදු වුණා. බඩු මිල වැඩි වුණා. ආර්ථිකයේ ප්‍රශ්න ඇති වූ විට එය විවිධ අංශවලට දැනෙනවා.

අප මේ සියලුම දේ කළේ රට වෙනුවෙනුයි. රට ගොඩනැගීම සඳහායි. ඊළඟ පරපුරට ණය බර සහිත ආර්ථිකයක් නොව, ණය ගෙවීමට හැකි ආර්ථිකයක් බිහි කිරීම සඳහා 2025 ඉලක්ක කර ගනිමින් අප මේ වැඩසටහන ඉදිරියට ගෙන යනවා.

මෙම කාර්යයන් කරන විට විවිධ ප්‍රශ්නවලට මුහුණදීමටත් සිදු වුණා. මහනුවර ජාතිවාදී කෝලාහල ඇති වුණා. ප්‍රාදේශීය සභා මැතිවරණවලින් පරාජයට පත් වන්නට සිදු වුණා. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් ලෙස අප ඒ පරාජය පිළිගත්තා. අඩුපාඩු හදා ගෙන ඉදිරියට යාම සඳහා අඩිතාලම දමා තිබෙනවා.

ගම ගොඩනැගීම සඳහා ගම් පෙරළිය වැඩසටහන ආරම්භ කර තිබෙනවා. එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන ආරම්භ කර තිබෙනවා. තවත් වැඩසටහන් ගණනාවක් ආරම්භ කළ යුතුව තිබෙනවා. දැන් අප රැකියා දීමේ වැඩසටහන අරඹා තිබෙනවා. සමෘද්ධිය ලබා දෙනවා. අප මේ වැඩකටයුතු කරමින් ක්‍රමානුකූලව ඉදිරියට යමු.

මේ සියලු දේ එක් වර කළ හැකි නම් මමත් කැමතියි. නමුත් එසේ කරන්නට බැහැ. මුලින්ම ස්ථාවර භාවයක් ලබාගෙන හවුල් ආණ්ඩුවක් ලෙස ඉදිරියට යා යුතුව තිබුණා. ඒ ගමනේ දී ජාතික ආණ්ඩුවේ සිටි කොටසක් ද සමග මට විරුද්ධව විශ්වාසභංගයක් ගෙන ආවා. ඒ පිරිස පසුව ආණ්ඩුවෙන් ඉවත් වී ගියා. මේ ප්‍රශ්න සියල්ලටම මුහුණ දෙමින් අප ඉදිරියට යනවා. ඒ

ගමන අප සාර්ථකව අවසන් කරනවා. ලබන වාරයේත් ජයග්‍රහණය කරනවා. 2025 වන විට දියුණු රටක් නිර්මාණය කර 2030 න් ද ඉදිරියට යාම සඳහා අප දැන් සැලසුම් සකස් කර තිබෙනවා.

අප දැන් අපේ පක්ෂය අලුතින් හදමු. පක්ෂය ඉදිරියට ගෙන යමු. ඒ සඳහා අප ගමට යා යුතුයි. නගරයට යා යුතුයි. සෑම ඡන්දපොළකම අපේ කණ්ඩායම් ස්ථාපිත කළ යුතුයි. ඒ වෙනුවෙන් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට උපකාර කර තිබෙනවා. ඉදිරි මාස දෙක ඇතුළත මූලික වැඩ කටයුතු අවසන් කර ගමේ කණ්ඩායම් එකතු කර ගන්නා ලෙස මහලේකම්වරයාට සහ ජාතික සංවිධායකවරයාට මා දැනුම් දී තිබෙනවා. ගමේ සංවිධායකවරුන්ට එය කරන්නට බැරි නම් ඔවුන් තවදුරටත් දේශපාලනය කිරීමෙන් ඵලක් නැහැ.

අපෙන් ඈත් වී සිටින අය නැවත අපට හවුල් කර ගනිමු. බලාපොරොත්තු එකවර ඉටු නොවූ විට ඇතැමුන් අපෙන් ඈත් වෙනවා. අලුත් තරුණ පරපුර ගොඩනැගිය යුතුයි. ඔවුන්ට රට බාර දිය යුතුව තිබෙනවා. ආණ්ඩුව මෙන්ම පක්ෂයත් අප ගොඩනගමු. පක්ෂයේ ඊළඟ නායක පරපුර දැන් ගොඩනගමින් සිටිනවා. මේ වැඩ කටයුත්ත ඉදිරියට ගෙන යාම සඳහා ඒ අයට බාර දෙනවා. 2025 වන තුරු මා සැලසුම් කරන්නම්. ඔවුන් 2030 දක්වා සැලසුම් කළ යුතුයි. අප දීර්ඝ කාලීන ගමනක් යා යුතුයි. අප එක්සත්ව ඉදිරියට යා යුතුයි. අප සියලුම දෙනා නැවත ගම් මට්ටමට බැස පක්ෂය හදා ගනිමු.

හොඳ කාලය මෙන්ම අමාරු කාලයක් තිබෙනවා. ටිකක් බැණුම් ඇසුවාට කමක් නැහැ. කුඹුරු වගා කරන විටත් හොඳ කාලයක් මෙන්ම නරක කාලයක් ද එනවා. 72 වන සංවත්සරයේ දී පක්ෂය වෙනුවෙන් වැඩ කටයුතු කළ සියලුම දෙනා මෙහිදී සිහිපත් කරනවා. 72 සංවත්සරයේ දී පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතු යළිත් අරඹමු.

## *එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මහතා*

අපේ සංවත්සරය දින හිතට විශාල ශක්තියක් එනවා. ගතට ලොකු ශක්තියක් දැනෙනවා. රටට නිදහස දුන් පක්ෂය වනුයේ එක්සත් ජාතික පක්ෂයයි.

මාතෘ භූමියේ නිදහස සුරක්ෂිත කළේ අපයි. අපේ අතීත නායකයන් සෑම විටම කැපවූයේ සෞභාග්‍යය ශක්තිමත් මව්බිමක් බිහි කිරීම සඳහායි. අගමැතිතුමන්ගේ ශක්තිය තුළ ආර්ථික, සමාජයීය නිදහස මෙන්ම සුබසාධන සංවර්ධනය ඇති වෙමින් තිබෙනවා.

නව යුගයට ඔබින සංවර්ධිත ශ්‍රී ලංකාවක් සදහා අප කැපවිය යුතුයි. සැමට සෞභාග්‍ය උදාකරන ශක්තිමත් ගමන අප අදින් අරඹමු.

මේ වන විට අප රජය දැවැන්ත සංවර්ධිත යෝජනා ක්‍රම රැසක් ක්‍රියාත්මක කරනවා. ගම්පෙරළිය, එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන් ගමින් ගමට, දොරින් දොරට යනවා. පවුල් ලක්‍ෂ තුනකට පමණ මේ වන විට අප නිවාස ශක්තිය දී තිබෙනවා.

ජනාධිපති සහ අගමැති මෙන්ම මුදල් ඇමැති කොන්දේසි විරහිතව අපගේ වැඩපිළිවෙළ සඳහා උපකාර කර තිබෙනවා.

අපගේ ප්‍රතිවාදීන් අනුන් ඉදිකළ ධාතු මන්දිර විවෘත කරමින් සිටිනවා. බොරු මාධ්‍ය සංදර්ශන පවත්වමින් ඉන්නවා. පසුගිය රජයේ සිටි නඩය බොරුව ඇත්ත කිරීමේ අසාර්ථක මෙහෙයුමක නිරත වෙමින් සිටිනවා.

ජනපති, අගමැති, මන්ත්‍රී තනතුරු අපට ලැබෙන තාවකාලික වගකීමක් පමණයි. ඒ තනතුරු සින්නක්කර ඔප්පුවකින් ලියා ගන්නට පසුගිය රජයේ උදවිය කල්පනා කළා.

රාජ්‍ය බලය ඇති මොහොතේ අප අපේ වගකීම ඉටු කළ යුතුයි. හැන්ද තිබෙන මොහොතේ අප සැමට බෙදා දිය යුතුයි. හැන්ද තිබෙන මොහොතේ හැන්ද ගැන සිතීම ගැන පසෙකලා පාක්ෂිකයන් ගැන සිතිය යුතුයි. නීති රෙගුලාසි පසෙකලා ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට අගැමතිතුමා දැනටමත් ක්‍රියාත්මක කරනවා. අගමැතිතුමාගේ තීක්‍ෂණ බුද්ධිය උපයෝගී කරගෙන තම කටයුත්ත ඉටු කරාවි.

සැප්තැම්බර් 05 වැනිදා දිනය බොහෝ අය රටට අලෙවි කළා. මෙය අරක්කු, කසිප්පු සාජ්ජයක් පමණක් වන බවට මා අනාවැකියක් කිව්වා. එය සත්‍යයක් බවට පත් වුණා. අවසානයේ දුටුවේ තොවිල් නාඩගමක් පමණයි. කොළඹ වටලන බව කියූ අය වැටලූයේ ලේක් හවුස් වටරවුමයි. රටට හෙටක් වෙනුවට පුතාට හෙටක් නිර්මාණය කිරීම රාජපක්‍ෂගේ අරමුණ වුණා.

ජනතාව දුක්විඳිද්දී බබා ඇතුලු සංවිධායකයින් ආවේ තරු පහේ හෝටල්වල සිටයි.

අගමැතිතුමා කියනවා නම් අපේ ශක්තිය පෙන්වන්න මා සූදානම්. ගෝල්ෆේස් පිටියට ලක්‍ෂයක් ගෙන්වා ජන බලය තිබෙන්නේ කාටදැයි පෙන්වමු.

*__එක්සත් ජාතික පක්‍ෂයේ මහලේකම් සහ අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා__*

පක්‍ෂයේ 72 වන උපන් දිනය දවසේ මා කතා කරන්නේ ඉතා අභිමානයෙන්. එක්සත් ජාතික පක්‍ෂයේ මිනී පෙට්ටියේ අවසන් ඇණය ගැසූ බව පිලිප් ගුණවර්ධන මහතා වරක් පැවසුවා. එක්සත් ජාතික පක්‍ෂය ඒ කිසිවෙකුටත් දුර්වල කරන්න බැහැ. එක්සත් ජාතික පක්‍ෂය තවමත් තරුණයි. සීගිරි පර්වතය වගේ නොසැලී සිටිනවා.

අද අප ශක්තිමත් අනාගතයක් ගොඩනගමින් සිටිනවා. අප සැම විටම ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් පක්ෂයක් ලෙස ක්‍රියා කළා. අප රාජ්‍ය නායකත්වය ලබා ගැනීමේ සටන ඇරඹිය යුතුයි. වසර 24 ක් පුරා අපට ජනාධිපතිවරයෙකු සිටියේ නැහැ.

වසර 24 කට පසු අපට නැවත අවස්ථාවක් උදා වෙනවා. ඒ සඳහා අප පියවරෙන් පියවර ඉදිරියට යා යුතුයි. රාජ්‍ය නායකත්වය ලබාගත යුතුයි.

විශාල ජයක් ලැබුවා යැයි පොහොට්ටු පක්ෂය සිතා සිටියා. පෙබරවාරි 10 වැනි දා ඔවුන් ගත්තේ පාවිච්චි වූ ඡන්දවලින් 40% ක් පමණයි. 60% ක් භාවිත වී තිබුණේ පොහොට්ටුවට විරුද්ධවයි.

ජනාධිපතිවරණය අපට ඉතා වාසි සහගතයි. ජනාධිපතිවරණය ජයගත් සැනින් පාර්ලිමේන්තු මැතිවරණය පවත්වා 2/3 ක බලයක් ගෙන එක හුස්මට වසර 10 ක් රට පාලනය කිරීම අපේ අරමුණයි.

කොළඹ වටලන බව පොහොට්ටුව කිව්වා. දවස් ගණනක් ඉන්න බලා සිටි අය පැය දෙක තුනකින් දියාරු වී පළා ගියා. වෙනත් රටවල මෙවැනි ජනබල මෙහෙයුම් කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට ගිය විටයි. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කළ ආණ්ඩුවකට එරෙහිව ජනතාව පෙළගැස්විය නොහැකි බව පස්වැනිදා ඔප්පු වුණා.

***<u>එක්සත් ජාතික පක්ෂයේ සභාපති සහ මහාමාර්ග හා මාර්ග සංවර්ධන කබීර් හෂීම් මහතා</u>***

කොටි ත්‍රස්තවාදීන්ගෙන් විශාලම තර්ජනය තිබුණේ අපේ නායකයන්ටයි. අපේ නායකයන් විශාල පිරිසක් පක්ෂය සහ රට වෙනුවෙන් ජීවිතය පූජා කළා.

ජීවිතය පරදුවට තබාගෙන පාක්ෂිකයන් අප සමග සිටියා. දේපොළ, නිවාස ගිනි තබද්දීත් ඔබ පක්ෂය සමග සිටියා. අප "මම" යන මතය දුරලා පක්ෂය මුල් කර ගෙන වැඩ කළා. සීමිත බලයක් යටතේ වුවත් අප වැඩ කිරීම ආරම්භ කර තිබෙනවා.

අමාරු වසර 22 ක් ගත කළ ඔබ මේ වසර කිහිපය හරියට දේශපාලනය කළහොත් 2030 මැතිවරණ ජයත් අපටයි.

අපට නැවතත් වරද්දා ගන්න බැහැ. මහින්ද කියූ වෙසක් පෝයවල් රාශියක් පසු වුණා. විශ්වාසභංග ගෙනාවා. 5 වැනිදා අවසන් උත්සාහයත් දැරුවා.

ජනතාව තලා පෙළා බලු කුක්කන්ගේ ආහාරවල මිල අඩු කළ අය දැන් පාරට බැස උද්ඝෝෂණය කරනවා. නාමල් බේබි ලංකාවේ විශ්ව විද්‍යාලයකටවත් ගියා නම් උද්ඝෝෂණයක් කරන හැටි අන්තරේ කියා දේවි.

රෑ වන විට ඒ අය ගෙන ආ ජනතාව සියලුම දෙනා කොළඹින් පිට වුණා. ඉතිරි වුණේ පවුලේ කිහිප දෙනෙක් පමණයි.

අද සිට අපේ පක්ෂය හදමු. ආණ්ඩුව ගොඩනගමු.

*එක්සත් ජාතික පක්ෂයේ උප නායක සහ පාර්ලිමේන්තු මන්ත්‍රී රවී කරුණානායක මහතා*

පොහොට්ටුව 5 වැනිදා නොපිපීම පරවුණා. ඔවුන් කන්දක් විලිලා මී පැටවෙකු වැදුවා. හයිබ්‍රිඩ් පොහොට්ටුවක් හදන්න යන විට සිදු වන්නේ මෙයයි. පොහොට්ටුව මෙතරම් අසාර්ථක වේවි යැයි අපවත් සිතුවේ නැහැ.

වැඩි කල් යාමට පෙර අප සැබෑ ජනකායක් කොළඹට ගෙන ඒමට සූදානම්. ඩී.එස්. සේනානායක මහතා එක්සත් ජාතික පක්ෂය බිහි කළේ සියලුම ජාති, ආගම් එක්සත්ව සලකන යුගයක් නිර්මාණය කිරීම සඳහායි.

අප එකමුතු භාවය තුළින් 2030 දක්වා රට පාලනය කරනවා. අසාර්ථක පාලනය වෙනුවට සාධාරණ මනුෂ්‍ය පාලනයක් බිහි කිරීමට අපට හැකි වුණා. එක්සත් ජාතික පක්ෂයේ දරදිය ඇදපු අලි සමග අලුතින් සිතා ඉදිරියට යන ගමන 72 වන සංවත්සරයෙන් ආරම්භ කරමු. එක්සත් ජාතික පාක්ෂිකයන්ට මුල් තැන දී රට හදන අතරතුර පක්ෂය ගොඩනැගීමටත් ක්‍රියා කරමු.

*එක්සත් ජාතික පක්ෂයේ ජාතික සංවිධායක සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය නවීන් දිසානායක මහතා*

ජාතියේ පියා වන ඩී.එස්. සේනානායක මහතා විසින් මීට වසර 72 කට පෙර උදාර පක්ෂයක් බිහි කළා.

ආර්ථිකය විවෘත කරමින් ජනතා සහන දෙන්න අපට හැකි වුණා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කැපවූ එකම පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි. මෙතෙක් කිසිඳු දේශපාලන පක්ෂයක රහස් ඡන්දවලින් නායකයා පත් කර නැහැ. ඇතැම් පසුබෑම්වලට ලක්වුව ද ජීවමාන පක්ෂයක් ලෙස අප හැම විටම නව ජවයකින් නැඟිටිනවා.

අපි එකමුතුවෙන් ශක්තිමත්ව ඉදිරියට යමු. පක්ෂය ගොඩනැගීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් සමුළු රාශියක් පැවැත්වීම ආරම්භ කර තිබෙනවා. පක්ෂය ජයග්‍රාහී මාවතකට ගත හැකි එකම මාර්ගය පාක්ෂිකයා බලා ගැනීමයි. රැකියා, සමෘද්ධිය, ගම්පෙරළිය ආදී ව්‍යාපෘතිවලින් පාක්ෂිකයාට වැඩිපුර සහන දීමට නායකතුමා තීරණය කර තිබෙනවා.

පොහොට්ටුකාරයන් 5 වැනිදායින් පසුව මානසිකව අද වැටුණා. බැසිල් මාමා නැති නිසා නාමල් බේබිත් අසාර්ථක වුණා. එක්සත් ජාතික පක්ෂය සැම විටම කළේ පහළ සිට ඉහළට නායක පරපුරක් බිහි කිරීමයි. අප ළග පවුල්වාදයක් නැහැ. ඉදිරියේ දී අපේ සියලු කටයුතු සිදු කරන්නේ පාක්ෂිකයා ඉලක්ක කර ගෙනයි.

ගෝත්‍රවාදී පවුලකට නැවත පාලන බලයක් දීමට හැකියාවක් නැහැ. ලබන වසරේ ඕනෑම මැතිවරණයකට මුහුණදීමට හැකි තත්ත්වයකට අපි පක්ෂය පරිවර්ථනය කරනවා.

***<u>එක්සත් ජාතික පක්ෂයේ මාධ්‍ය ප්‍රකාශක, විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය හරින් ප්‍රනාන්දු මහතා</u>***

එදා සිදුවුනේ හොරුන්ගේ රස්තියාදුවක් පමණයි. මෙහිදී මා අරුම පුදුම සිද්ධි කීපයක්ම දුටුවා. ටාජ් සමුද්‍රා හෝටලය ඉදිරිපිට අලංකාරයට වවා තිබෙන පොල් ගසකට නැගුනු වහල්ලු පිරිසක් කුරුම්බා කඩාගෙන බොන අයුරු මා දුටුවා. තව කීප දෙනෙක් ලයිට් කණුවක් උඩට නැග විකාර කරමින් සිටියා. ඒ සිදුවීම් දෙකම පොහොට්ටුව පිළිබඳව හොඳ නිර්වචනයක් බව කිව යුතුයි.

මේ අය රෑ එළිවෙනතුරු සිටින බව පැවසුවා. එලෙස සිටියා නම් බත් පැකට් දහසක් හදා ගෙන ගොස් දීමට මා කටයුතු කරනවා. රාජපක්ෂලාට අවශ්‍ය අරලියගහ මැදුර, ජනාධිපති මැදුර ආදියෙහි සැප විදිමට පමණයි. රට ගොඩනැගිය හැකි එකම පක්ෂය වන්නේ එක්සත් ජාතික පක්ෂයයි. මේ උත්ඝෝෂණයට පැමිණී සිටි කිහිප දෙනෙක්ම මත්වී පාරේ වැටී සිටින විට සුව සැරිය හිලන් රථවලින් රැගෙන යන අයුරු මා දුටුවා. උදය ගම්මන්පිල වැනි අයත් නුදුරේදීම එවැනි ඉරණමකට ලක්වනු ඇතැයි මා සිතනවා.